අන්තර් පාරිවේණික භාෂා හා සාහිත්‍ය තරගය - 2019

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන ශාඛාව

දිස්ත්‍රික් තරග වටය

සිංහල භාෂා හා සාහිත්‍යඥාන තරගය - ජ්‍යෙෂ්ඨ අංශය කාලය පැය 3

ඉහත ප්‍රශ්නය ඇතුළුව II හා III කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරා ගෙන ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න

පහත සඳහන් පාඨවල අර්ථය ලියා ඉරි ඇඳි පදවල විභක්තිය නම් කරන්න.

i. වත්මෙනති නොවව් ඉසුරුමින්
ii. එ පුරේ නිරිඳෙක් වී.
iii. සිරිවඩිය ප්‍රියතම උවිදු.
iv. ගිරියගෙන් නොයි නිවට.
v. පඹවන වන තඹරානට නිගා දින්.
vi. වතින් ගුරුන් අපියනු.
vii. ඔත් සිපිනු කළ අත්තම.
viii. රවුලා මැරී රම්රජ
ix. ගමළේ බලාම් කෙරේ.
x. වැද රද පදුතමල.

(ලකුණු 2x10 - 20)

කෙටි පිළිතුරු සපයන්න.

i. අමාවතුර හැඳින්වෙන අපරනාමය නම් කරන්න.
ii. බුත්සරණ හැඳින්වෙන අපරනාමය නම් කරන්න.
iii. සියබස්ලකර රචනා වූ යුගය නම් කරන්න.
iv. සිංහල භාෂාව සඳහා රචිත පැරණිම ව්‍යාකරණ ග්‍රන්ථය කුමක් ද?
v. සිගිරි ගී කවර සාහිත්‍ය යුගයට අයත් වන්නේ ද?
vi. ලංකාවේ මුල්ම සන්දේශ වූ මයුරසන්දේශයේ රචකයා කවරෙක් ද?
vii. අකුරට යන වෙලාවේ කෙටි කතාවේ රචකයා කවරෙක් ද?
viii. දහම්ගැට මාලාව කාගේ කෘතියක් ද?
ix. දිර්ඝතම සන්දේශ කාව්‍යය ලෙස හැඳින්වෙන සිංහල සන්දේශය නම් කරන්න.
x. "සිංහල පෙළි" යනුවෙන් හැඳින් වූ කෝලම යුගයේ විසූ කවියා කවරෙක් ද?

(ලකුණු 2x10 - 20)

## II කොටස

"අඟ පාමොක් වන - සමුදාමැ හෝ එපදත්
අනරුත වූ පද සමාසි - අනරුත් සමස් නම් වේ"

i. ඉහත පාඨයේ අර්ථය දක්වන්න. (ලකුණු 5)
ii. අන්‍යාර්ථ සමාසයේ ප්‍රභේද දෙක නම් කරන්න. (ලකුණු 5)
iii. ඒ (දෙකට) උදාහරණ දෙක බැගින් දෙන්න. (ලකුණු 5)

03. "සඳුනු දෙව්දුරුම් - සර අත් හලස් වෙසෙසින්
මුසුනු සියලු විමනේ - ඵ දෙක සිය රූ නො මියා"

i. මෙම කවියේ අර්ථය දක්වන්න .
ii. කාව්‍යයන්හේ දෙව්දුරුම් ප්‍රභේදය නම් කරන්න.
iii. ඒ දෙකට උදාහරණ දෙක බැගින් දෙන්න.

04. "පෙර පර වණක් තිබී - විදිති ගළපනු සඳහාම
වණ ලොප් අදෙස් ආ එහි - ලැසියනු සඳින් දන්නේ "

i. මෙහි අර්ථය දක්වන්න.
ii. සන්ධි වර්ග නමය නම් කරන්න.
iii. එක් එක් සන්ධියට උදාහරණය බැගින් දෙන්න.

## III කොටස

05. පහත සඳහන් සන්දේශ කාව්‍යයන් ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. සැළලිහිණි සන්දේශය - පිටත්වන ස්ථානය - ලඟාවන ස්ථානය - කතුවරයා
ii. මයුර සන්දේශය - පිටත්වන ස්ථානය - ලඟාවන ස්ථානය - කතුවරයා
iii. හංස සන්දේශය - පිටත්වන ස්ථානය - ලඟාවන ස්ථානය - කතුවරයා
iv. ගිරා සන්දේශය - පිටත්වන ස්ථානය - ලඟාවන ස්ථානය - කතුවරයා
v. පරවි සන්දේශය - පිටත්වන ස්ථානය - ලඟාවන ස්ථානය - කතුවරයා

(ලකුණු 3

06. පහත සඳහන් පද්‍ය ඇතුලත් වන ග්‍රන්ථයේ නම එහි කතුවරයා හා යුගය නම් කරන්න.

i. රජ පැමිණි බෝසත් - සත් රුවන් නො ද මැඩවිණි
ii. සුවිණ ගී සඳුරා - විගෙන ඇසිරු කිසඳුරා .
iii. සැරද පුළුකළ දුරු - මියුරු තෙපලෙන් රඳනා
iv. සව්සිරිවිනි සාරය - - කිවිඳු හෙ බිම්බිසාරය
v. දහම්ට සම්බන්ධ එළුවෙන් පෙර සී

07. පහත සඳහන් කෘති ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. ( අන්තර්ගතය පිළිබඳ කෙටි දැක්විය යුතුය)

i. කාව්‍යශේඛරය - කර්තෘ - යුගය - අන්තර්ගතය
ii. ජානකීහරණය - කර්තෘ - යුගය - අන්තර්ගතය
iii. සඳකිඳුරු දාකව - කර්තෘ - යුගය - අන්තර්ගතය
iv. අමාවතුර - කර්තෘ - යුගය - අන්තර්ගතය
v. කව්සිළුමිණ - කර්තෘ - යුගය - අන්තර්ගතය

අන්තර් පාරිවේණික භාෂා හා සාහිත්‍ය තරගය - 2019

සිංහල භාෂාව හා සාහිත්‍යය - ජ්‍යෙෂ්ඨ අංශය

දිස්ත්‍රික් තරග වටය

# පිළිතුරු පත්‍රය

කොටස

ධනවතුනි, සම්පත්තියෙන් මත් නොවන්න. - ආලපන විභක්තිය

ඒ නගරයෙහි රජ කෙනෙක් විය. - ආධාර විභක්තිය

ශ්‍රියා කන්තාවගේ ස්වාමියා විෂ්ණු ය. - සම්බන්ධ විභක්තිය

නිගණ්ඨයා ලැජ්ජාවෙන් තොර ය. - අවධි විභක්තිය

පබාවතියගේ මුහුණ නෙළුම්මලට නිගා කළේය. - සම්ප්‍රදාන විභක්තිය

වත් පිළිවෙතින් ගුරුවරයා සතුටු කරනු. - කරණ විභක්තිය

පින් නැමති ශිල්පියා කළ අත්වැඩ. - කර්තෘ විභක්තිය

රාම රජ රාවණ මැරීය. - කර්ම විභක්තිය

භටයා යුද්ධ කරයි. - ප්‍රථමා විභක්තිය

රජුගේ පාපියුම් වැද - කර්ම විභක්තිය

(ලකුණු 2x10 - 20)

කාලිංග එළුව

අමාතවත

අනුරාධපුරය

සිදත් සඟරාව

අනුරාධපුරය

කවිශ්වර

මහාචාර්ය ඒ.වී සුරවීර

විදාගම මෛත්‍රිය හිමි

කෝකිල සන්දේශය

එච්.එම් කුඩලිගම

(ලකුණු 2x10 - 20)

II කොටස

අංග ප්‍රධානව හෝ සමූහ ප්‍රධානව ද නිපාතයෙන් පද කීපයක් එක් වන්නේ නම් එය දකාරාර්ථ සමාස නම් වේ. (ලකුණු 5)

* අංග ප්‍රධාන දකාරාර්ථ සමාසය * සමූහ ප්‍රධාන දකාරාර්ථ සමාසය (ලකුණු 5)

උදා : අංග ප්‍රධාන - දෙවිබඹ සුරෝ , මව්පියෝ

සමූහ ප්‍රධාන - ඉරහඳ, ගස්වැල්, ගීනැටුම් (ලකුණු 5)

ස්වර අන්ත කොට ඇති හල් අකුරු අන්ත කොට ඇති නාමයෝ විභේෂයෙන් බහු වචනයේ දී ස්වකීය රූපය අත් නොහැර සිටින්නෝ ය. (ලකුණු 5)

I. * ස්වරාන්ත නාම පද * හලන්ත නාම පද (ලකුණු 5)

II. * [illegible] - බලු, ගොළු, හා, නර, ඇබි

* [illegible] (ලකුණු 5)

04. පූර්වාපර වර්ණයන් කිසි ආකාරයෙන් ගැළපීම සන්ධි නම් වේ. ඊ සඳහා අකුරු ලොප් කිරීම, ආදේ:
ඇදිය ලෝක ව්‍යවහාරය අනුව දැනගත යුතුය.

| | |
|---|---|
| i. පෙරසර ලොප් සඳ | vi. ගසුරු දෙප් සඳ |
| ii. පරසර ලොප් සඳ | vii. පෙර රූ සඳ |
| iii. සර සඳ | viii. අගම් සඳ |
| iv. සරදෙප් සඳ | ix. දෙරූ සඳ |
| v. ගසුරු ලොප් සඳ | |

•එක් සන්ධි වර්ගයකට එක බැගින් උදාහරණ දක්වා තිබිය යුතුය.

## III කොටස

| 05 | නිර්මිත ස්ථානය | ළඟවන ස්ථානය | කතුවරයා |
|---|---|---|---|
| i. සැළලිහිණි සන්දේශය | - ජයවර්ධනපුර | - කැලණිය | - ශ්‍රී රාහුල හිමි |
| ii. මයූර සන්දේශය | - ගම්පොළ | - දෙවිනුවර | - කවීශ්වර |
| iii. හංස සන්දේශය | - ජයවර්ධනපුර | - කැරගල පද්මාවතී පිරිවෙන | - විදාගම හිමි |
| iv. ගිරා සන්දේශය | - ජයවර්ධනපුර | - තොටගමු විහාරය | - අඥාතයි |
| v. පරවි සන්දේශය | - ජයවර්ධනපුර | - දෙවි නුවර | - ශ්‍රී රාහුල හිමි |

(ලකුණු 3 x

| 06. පොත | කතුවරයා | යුගය |
|---|---|---|
| i. කව්සිළුමිණ | දෙවන පණ්ඩිත පරාක්‍රමබාහු රජු | දඹදෙණිය |
| ii. මුවදෙව්දාවත | අඥාතයි | පොළොන්නරු |
| iii. සැළලිහිණිය | ශ්‍රී රාහුල හිමි | කෝට්ටේ |
| iv. ගුත්තිල කාව්‍යය | වැත්තෑවේ හිමි | කෝට්ටේ |
| v. ලෝවැඩ සඟරාව | ii. විදාගම හිමි | කෝට්ටේ |

(ලකුණු 3 )

07. පහත සඳහන් කෘති ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | කර්තෘ යුගය | අන්තර්ගතය (කෙටි විස්තරයක් ඇතුළත් විය යුතු |
|---|---|---|
| i. කාව්‍යශේඛරය | - ශ්‍රී රාහුල හිමි, කෝට්ටේ , | සත්තුභත්ත ජාතකය පදනම් කොට රචනා වී ඇ මහා කාව්‍යයකි. |
| ii. සුභාෂිතය | - අලගියවන්න මුකවෙටි, සීතාවක | සමාජයට උපදෙස් දීම සඳහා ලියවී ඇත. පාලි සංස්කෘත පොත්වල අභාසය ලබා ඇත. |
| iii. සඳකිඳුරු දාකව | -විල්ගම්මුල හිමි ,කුරුණෑගල | චන්දකින්නර ජාතකය පදනම් කොට ලියවී ඇ කිඳුරත් යශෝදරා අතර ප්‍රේමය විස්තර කැරෙ |
| iv. අමාවතුර | - ගුරුළුගෝමී , පො/නරු | පුරිසදම්ම සාරථී බුදු ගුණය මුල් කොට ලියවී විවිධ දමන කථා ඇතුළත්ව ඇත. |
| v. කව්සිළුමිණ | - දෙවන පැරකුම්බා රජු, දඹදෙණි | කුස ජාතකය පදනම් කොට ලියවී ඇත. ප්‍රථම මහා කාව්‍යයයි. කුස පබා ප්‍රේමය විස්ත |